# මහින්ද රාජපක්ෂ මහතාගේ ජය තහවුරු කළ යුත්තේ ඇයි?

අප මහින්ද රාජපක්ෂ දිනවිය යුත්තේ, අප ජයග්‍රාහී ජාතියක් බවට පත් කිරීම වෙනුවෙන් කළ ගුණ සැලකීමට පමණක් නොවේ. ඒ ඔහු, සරත් පොන්සේකා මෙන් දින 180 කට පසු තම තනතුර අතහැරීමට නොව, රටට වැඩක් කිරීම සඳහා ඡන්දය ඉල්ලන නිසාම ද නොවේ. ඔහු, 1948 න් පසුව සිටි සියළු පාලකයන්ට වඩා මේ රටේ අනාගතය වෙනුවෙන් කැපවූ නායකයා වෙයි. මෙහි සෘජු ප්‍රතිඵලයක් ලෙස අද අපට අප විසින් විසඳන ලද ප්‍රශ්නයක් ලෙස පෙන්විය හැකි දෙයක් තිබේ. මෙතෙක් මෙරට පැවති දේශපාලන සංස්කෘතිය වූයේ, පවතින රජය යටතේ බඩුමිල වැඩි වීමත්, අල්ලස් දූෂණ සිද්ධවීමත්, ආදිය පෙන්වා දීම සහ ඊට අමතරව මොනවා හෝ බොරු පොරොන්දු ටිකක් දීම ඔස්සේ ආණ්ඩු බලය ලබා ගෙන එහෙත් තම පාලන කාලය තුලදී රටේ පවතින එකද ප්‍රශ්නයක් හෝ විසඳන්නේ නැතිව ඊළඟ මැතිවරණය තෙක් ජනතාවට කොකා පෙන්වමින් සිට අප රට අගාධයෙන් අගාධයට ගෙනයාමයි.

2005 දී අපි මේ තත්වය වෙනස් කළ හැකි වූ පාලකයකු පත් කර ගත්තෙමු. මහින්ද රාජපක්ෂ යනු දුන් පොරොන්දු ඉටු කළ නායකයෙකි. අප රටේ බොහෝ සම්පත් ඇති බවත් අපේ මිනිසුන් බොහෝ දක්ෂයක් බවත් අපට නොයෙක් විට ඇසේ. එහෙත් මේ දක්වා අපිට එකද ප්‍රශ්නයක් හෝ විසඳාගත නොහැකිව තිබ්බ. මීට හේතුව කුමක්ද? මහින්ද රාජපක්ෂ අන් සියළු නායකයන්ට වඩා සාර්ථක නායකයකු වන්නේ ඔහු මේ රහස වටහා ගෙන ක්‍රියා කළ බැවිනි. 1948 දී සුද්දන් අප රටෙන් ගියා යැයි අප සිතුවත් සුද්දෝ අපේ ඔළුගෙඩි පාලනය කිරීම දිගටම කර ගෙන ගියහ. අපේ පාලකයන් සිතුවේ පැතුවේ සුද්දන්ගේ අදහස් උදහස් අනුවය. එහි ප්‍රතිඵලය වූයේ "අපට පැරදවිය නොහැකි තරම් කොටි බලවත්ය", "අපට සාමය උදාකර ගත හැක්කේ කොටි සමග සාකච්ඡා කිරීමෙන් පමණි", ආදී ලෙස කියැවුනු බටහිර දැනුම අනුව සිතීමට අපේ පාලකයන් පෙළඹීමයි.

මේ තත්වය වෙනස් වූයේ බටහිර දැනුම ගැන තැකීමක් නොකර, "මේ රටේ සාමය ඇති කිරීමට නම් කොටි සමූල ඝාතනය කළ යුතුය" යන දේශීය දැනුම පිළිගෙන ක්‍රියා කිරීම නිසාය. ඒ ඔස්සේ මැතිවරණවලින් ජයගැනීම සඳහා දෙමළ, මුස්ලිම් ඡන්ද වලට වඩා සිංහල ඡන්ද ලබා ගැනීම ගැන උනන්දු විය යුතු තැනට රට මෙහෙය වීමට මහින්ද රාජපක්ෂට හැකි වී තිබේ. බටහිර දැනුමට පටහැනිව ක්‍රියා කිරීම නිසා බටහිර රටවල උදහසට ලක් වීමට මහින්ද රාජපක්ෂට සිද්ධවුනු අතර බටහිර විරෝධී චීනය, රුසියාව, මියන්මාරය, ඉරානය, ලිබියාව, වෙනිසියුලාව, ආදී රටවල මිතුරකු වීමට අප රටට හැකි විය. ජිනීවා මානව හිමිකම් ඡන්දයේ දී ශ්‍රී ලංකාව ලබා ගත් ඉහල වැඩි ඡන්ද සංඛ්‍යාවට හේතුව බටහිර ගැත්තෙකු නොවන ස්වාධීන රාජ්‍යයක් ලෙස මහින්ද රාජපක්ෂ යටතේ අප රට ජාත්‍යන්තරව ලබා ගෙන තිබූ කීර්තියයි. දැන් ශ්‍රී ලංකාව සමග මිත්‍ර විය යුතු බව ඇමරිකානු සෙනේට් වාර්තාවක් පවසයි.

කොටි සංවිධානය යනු යුධමය ලෙස දුර්වල සංවිධානයකි. එහි ප්‍රධාන ශක්තිය වූයේ බටහිර රටවලින් එය ලද අනුග්‍රහයයි. කොටි ආරක්ෂා කළ බටහිර ආධිපත්‍යය නොතකා ක්‍රියා කළ හැකි එකම නායකයා මහින්ද රාජපක්ෂ වන අතර එවැනි නායකයකු නොමැතිව කොටි සංවිධානය පරාජය කිරීම සිහිනයකි. 2005 දී මහින්ද රාජපක්ෂ පරාජය විනි නම්, බටහිරයන් අපේ පාලකයන් නටවද්දී, මුළු රටම කොටි ත්‍රස්තවාදීන් විසින් යටත් කර ගැනීමට ඉඩ තිබූ බව, උන් සතුව තිබුනු ආයුධ ශක්තිය අනුව පැහැදිලිය. බටහිරයන්ගේ ගැත්තෙකු නොවී සිටීමට අවශ්‍ය දේශපාලන ශක්තිය මහින්ද රාජපක්ෂ සතුවන අතර එය මූලිකවම පසු ගිය පළාත් සභා ඡන්ද මාලාවේ දී ඔහු ලබා ගත් ඉහල වැඩි ඡන්ද ප්‍රමාණය නිසා ලැබී තිබේ. මෙවර මහින්ද රාජපක්ෂ ලබන්නේ සුළු වැඩි ඡන්ද ප්‍රමාණයක් නම් එය, ශ්‍රී ලංකාවට අත පෙවීමට බටහිර රටවලට දොර ඇරීමක් වනු ඇත. සරත් පොන්සේකා දක්ෂ යුධ නිළධාරියකු වුවද කොටි පරාජය කළ හැකි එකම යුධ නිළධාරියා ඔහු පමණක් නොවේ. සරත් පොන්සේකා ගේ සේවය අතිශයෝක්තියට නැංවෙන්නේ, සුපුරුදු පරිදි, කොටින්ගේ යුධ ශක්තිය අධිතක්සේරු කිරීමෙන් හා කොටින් බටහිරින් ලද සහාය අවතක්සේරු කිරීමෙනි.

අද අපට අවශ්‍ය වන්නේ ලද යුධ ජය පෙරට ගෙන යාමයි. එසේ කර, දෙපයින් නැගී සිටිය හැකි, සාඩම්බර ප්‍රබල රාජ්‍යයක් ගොඩනැගීමයි. එහිදී, අපේ හමුදා ජයග්‍රහණ ව්‍යවස්ථාව තුලට ගෙන යාමත්, අපේ ප්‍රවාද මත පදනම් වන සංවර්ධන සැලස්මක් නිර්මාණය කර ගැනීමත්, අත්‍යාවශ්‍ය වෙයි. එහිදී නැවතත් තමන්ට මැතිවරණ වලට ඉදිරිපත් වීම අහුරන විධායක ජනාධිපති ව්‍යවස්ථාව වෙනස් කිරීමට බලා සිටින මහින්ද රාජපක්ෂ සමග, මෙතෙක් පසු ගිය යුධ දේශපාලන ජයග්‍රහණ වලදී ඔහු සමග සිටි ජාතිකවාදී බලවේග එක් වීම අනිවාර්ය වෙයි. රටට හිතකර ව්‍යවස්ථාවක් නිර්මාණය කළ හැක්කේ ජාතිකවාදී බලවේග බෙදෙන ලෙස කටයුතු කිරීමෙන් නොවේ. 2004 මහ මැතිවරණයේ දී ජාතිකවාදී ඡන්ද කැඩීමට ඇති කරන ලද භික්ෂු රැල්ලට අසුවූ ජනතාව, ටික කලකින්ම නන්නත්තාර වී ගිය අයුරු අපි දුටුවෙමු. මේ ආකරයටම අද දේශපාලන වශයෙන් නොමේරූ තරුණ කොටස්වල ඡන්දය ඩැහ ගැනීමට "පොන්සේකා" රැල්ලක් මවා ඇත. මේ රැලිවලට බොරු ජාතිකවාදී වෙස් මුහුණු පළඳවා තිබුනද ඒවා මෙහෙයවෙන්නේ වෙනත් තැන්වලිනි. තාවකාලික රැලිවලින් රටකට ලැබිය හැකි ජයක් නැත. සරත් පොන්සේකාට ජය ගැනීමට කිසිදු ඉඩක් නැතත් වැරදීමකින් හෝ සරත් පොන්සේකා ජනාධිපති වුවහොත්, ජනප්‍රිය දේශපාලකයකු විය නොහැකි ඔහුට ඉතිරිවන එකම විකල්පය නම්, බලයේ රැඳී සිටීම සඳහා ඇමරිකානු ගැත්තෙකු වී පිනෝෂේ වැනි ඒකාධිපතියකු වීම පමණි.

# සරත් පොන්සේකා මහතාට පරාජය හිමි වන්නේ ඇයි?

සරත් පොන්සේකා ගේ පරාජය නියතය. ඔහු අද පත්ව ඇත්තේ අඩුම තරමින් 82 දී හෙක්ටර් කොබ්බෑකඩුවට ලැබුනු සහායවත් නොලැබෙන ඛේදනීය තත්වයකටය. ඔහුට ජය ගැනීමට තබා ඡන්ද 47 ලක්ෂය හෝ ගැනීමට සුළු හෝ ඉඩක් වෙයි නම් ඔහුට ජනාධිපතිවරණ අපේක්ෂකත්වය දී රනිල් තම දේශපාලන අනාගතය පරදුවට තබන්නේ නැත. ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම වැනි කිසිදු ජනතා උද්යෝගයක් ඇති කළ නොහැකි සටන් පාඨයක් යටතේ තරග වැදීමට සරත් පොන්සේකාට සිදුවී ඇත්තේම, ජයග්‍රහණය කරවීමේ අරමුණකින් තොරව ඔහුව ඡන්දයට ඉදිරිපත් කෙරෙන බැවිනි. මේ නිසාම තමන් රට පාලනයට අවශ්‍ය බලතල තබා ගන්නා බව ආදී පරස්පර කථා කීමට ඔහුට සිදුවී ඇත. සරත් පොන්සේකාට හිමිවන බලතල ගැන නිශ්චිතව යමක් කීමට කිසිවකු දන්නේ නැත. තමන්ටවත් මතක නැති තරම් පොරොන්දු කන්දරාවක් දෙන සරත් පොන්සේකාට විධායක බලය නැතිව ඒවා ඉටු කළ නොහැක. ගිවිසුමක් නැතිවම ඔහුට සහාය දෙන එජාපයට සහ ජවිපෙට ඔහු කරන සියළු ප්‍රකාශ වලට වගකීමට සිදු වෙයි.

මිදි තිත්තයි කී නරියා සේ එජාපය විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට තීරණය කර ඇත්තේ මෙම ජනපතිවරණය මග හැරීමට එම පක්ෂයට සිදුවී ඇති නිසාම නොවේ. කොටි ත්‍රස්තවාදය අවසන් කිරීමත් සමග රටේ සිදු වී ඇති දේශපාලන වෙනස්කම් අනුව මතු දිනක හෝ ජනාධිපති ධුරය තමන් සන්තක කර ගැනීමට නොහැකි බව එම පක්ෂය දන්නා හෙයිනි. එජාපය යනු අද, කිසිසේත්ම, ජනතාව මතවාදීව අමතා දේශපාලන බලවේගයක් ගොඩනගා ගෙන, බලයට ආ හැකි පක්ෂයක් නොවේ. 1956 න් පසුවම වුවද, එජාපය බලයට පත් වී ඇත්තේ ඉතිහාසයේ නිතර සිදුවිය නොහැකි සුවිශේෂී සිදුවීම් හෝ මහා පරිමාණ ඡන්ද මංකොල්ල හෝ හරහා පමණි. 82 සහ 88 පැවති අන්ත දූෂිත ජනපතිවරණවලින් පසු එජාප ජනාධිපතිවරු පත් වී නැත. එජාපය පැත්තෙන් බලා ඇති කළ ජනාධිපති සහ සමානුපාතික නියෝජන ඡන්ද ක්‍රමවලින් එජාපය වැඩිපුර ලබා ඇත්තේ පරාජයන්ය.

2008 අයවැයට එරෙහිව එජාපය සමග එක්වී ඡන්දය දීමෙන් සහ මෙම ජනාධිපතිවරණයේදී එජාපය සමග එක්වී ඡන්දය ඉල්ලීමෙන් ජවිපෙ තම පොදු ජන පදනම අහිමි කර ගෙන ඇත. මහින්ද රාජපක්ෂ ගෙන් පළිගත යුතුය යන ජවිපෙ ඇතැම් නායකයන් ගේ තීරණය, සමාජය තුල තැනක් නැති වීම නිසා සමාජයට වෛර කිරීම ඔස්සේ පක්ෂයට ආකර්ෂණය වී සිටින ජවිපෙ සමාජිකයන් විසින් අනුමත කර ඇතත්, බහුතර ජනතාව ට අවශ්‍ය වන්නේ මහින්ද රාජපක්ෂ ට ගෞරව කිරීමට මිස ඔහුගෙන් පළිගැනීමට නොවේ. අද ජවිපෙට ජනතාව මෙහෙයවිය නො හැක්කේ, ජනතාව, ජවිපෙ විසින් ගොඩනැගීමට උත්සාහ ගන්නා දේශපාලන සංවාදයට වඩා දියුණු දේශපාලන සංවාදයක ආභාෂය ලබන බැවිනි. ජවිපෙ ට වඩා ඉදිරියෙන් සිටිනා ජනතාවට, කසිකබල් මාක්ස්වාදය කරපින්නාගෙන සිටින ජවිපෙ නොපෙනේ. ජවිපෙ ඡන්ද ප්‍රමාණය රඳා පවතින්නේ එය ජාතිකවාදයට නැඹුරු වීම මතයි. ජනාධිපතිවරණයෙන් ජය නොපතන එජාපය අද ජවිපෙ ඡන්ද පදනම දිය කර හරිමින් සිටියි. කිසිදු සංයුක්ත දේශපාලන මතවාදයක් ඉදිරිපත් නොකරන සරත් පොන්සේකා මෙරට දේශපාලන සංවාදයට පිටතින් සිටියත්, ඔහු සිතන්නේ එජාපයට බරවය.

ප්‍රභාකරන් ඝාතනය කිරීමෙන් පසුවත්, කාලතුවක්කු උණ්ඩ ආනයනය කිරීමට කටයුතු කළ පුද්ගලයකු, අල්ලස දූෂණයට එරෙහිව කරනවාය කියන ජනාධිපතිවරණ සටනට අපේක්ෂකයා ලෙස ඉදිරිපත් කිරීමෙන්, අල්ලස දූෂණයට එරෙහි ජවිපෙ සටන විගඩමක් බවට පත් වී තිබේ. 58 වන බලසේනාංකාධිපතිවරයාට ඊනියා යුධ අපරාධ චෝදනා එල්ල කළ සහ එසේ චෝදනා එල්ල කළ බව, තමන් විසින්ම සහ ජනාධිපතිවරණ සටනේ තම කඳවුරේ පුවත්පත් කතුවරියක් විසින් තහවුරු කර ඇති පුද්ගලයකු ට සහාය ලබා දීමෙන් ජවිපෙ තම ආත්මය හෙළි කර ඇත. විධායක ජනාධිපති ලෙස තේරී පත්වීමෙන් පසු සිදු කළ යුත්තේ අවශ්‍ය ව්‍යවස්ථාමය වෙනස්කම් කිහිපයක් සිදුකිරීම පමණක් නම්, ඒ සඳහා යොදවා ගත හැකි පුද්ගලයන් රාශියක් සිටියදී සහ ඒ සඳහා බලයට කෑදර නැති, අවම සදාචාරයක් සුරකින පුද්ගලයකු යොදවාගත යුතුව තිබිය දී, 13 වන සංශෝධනයෙන් ඔබ්බට යා යුතු බව, එජාප ආර්ථික ප්‍රතිපත්ති පිළිගන්නා බව සහ ජනාධිපති ධුරය සතු අසීමිත බලතල අත්හැරිය ද රට පාලනය සඳහා අවශ්‍ය බලතල තබා ගන්නා බව පවසන අයෙකු තම අපේක්ෂකයා ලෙස පිළිගැනීම නිසා ජවිපෙ ප්‍රතිපත්ති විකාරයක් බවට පත්වී තිබේ.

සරත් පොන්සේකාට සහායවීමට මනෝ ගණේෂන්, සම්පන්දන්, හකීම්, මංගල, රනිල්, රවි, රෝසි, ජයලත්, කෙලී සේනානායක, ලයනල් බොපගේ, ආදීන් එන්නේ, ඔවුන් වෙනස්වී ඇති නිසා නොව, සරත් පොන්සේකා ඔවුන්ට අවශ්‍ය පරිදි වෙනස් වී ඇති බැවිනි. බොරුව, දූෂණය, වංචාව, අවස්ථාවාදීකම, ආදියෙන් සරත් පොන්සේකා සාමාන්‍ය දේශපාලනඥයන්ට වඩා වෙනස් නැති බවත් එම නිසා ඔහු විකල්පයක් නොවන බවත් පැහැදිලිය. කප්පරක් විසංවාද මත ගොඩනගා ඇති සරත් පොන්සේකා ගේ ඡන්ද ව්‍යාපාරය එම විසංවාද ඔස්සේම කඩා වැටෙමින් ඇත. නන්දිකඩාල් දක්වා මහින්ද-ගෝඨා-සරත් ත්‍රිත්වය වැළඳගෙන සිටි සෑමොම ජනාධිපතිවරණයේ දී මහින්ද රාජපක්ෂ සමග සිටින අතර එම ත්‍රිත්වයට එරෙහිව සිටි කඳවුරට සරත් පොන්සේකා එක් වී ඇත. කොටි විරෝධී සටන මෙහෙයවූයේ සරත් පොන්සේකාය යන පට්ටපල් බොරුව ඔහුට පරාජය සහ විනාශය පමණක් ගෙන දෙනු ඇත.

**දේශප්‍රේමී භික්ෂු පෙරමුණ - චින්තන පර්ෂදය**